# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Services, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி:**(94) 011- 2694560** Telephone
ෆැක්ස් தொலைநகல்:**(94) 011- 2692254** Fax
ඊ-මේල් மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk** E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: **www.pubad.gov.lk** Web Site


මගේ අංකය எனது இல My No } CS/DOS/Policy/01/02
ඔබේ අංකය உமது இல Your No }
දිනය திகதி: Date } 2020.10.20

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>2020.01.01 දිනැතිව සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීම් ලද නිලධාරීන්ට වැටුප් ගෙවීම, පරිවාස වාර්තා සැපයීම හා අනෙකුත් ආයතනික කටයුතු සිදුකිරීම</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද උපදෙස්වලට වැඩිමනක් වශයෙනි.

02. 2018.08.20 දින බඳවා ගන්නා ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත් කරමින් 2020.06.17 දිනට පෙර නිකුත්කර ඇති පත්වීම් ලිපි/ සේවා ස්ථාන සංශෝධන ලිපි මගින් ඔබ ආයතනය වෙත අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ට 2020.06.17 දින දක්වා රාජකාරී භාර ගැනීමට අවස්ථාව ලබා දී ඇත. 2020.06.17 දිනෙන් පසුව නිකුත්කර ඇති පත්වීම් ලිපිවල එම පත්කිරීම්වලට අදාලව රාජකාරී භාර ගත යුතු දිනය සඳහන් කර ඇත.

03. දිවයින තුළ පැවති COVID-19 වසංගත තත්ත්වය හා ඒ සමග පැනවූ ඇඳිරි නීතිය හේතුවෙන් බහුතරයක් වූ නිලධාරීන්ට පත්වීම් ලිපි ලද වහාම සංවර්ධන නිලධාරී සේවයේ තනතුරු වල රාජකාරී භාර ගැනීමට නොහැකි වීම මත නිලධාරීන්ගේ වැටුප් ගෙවීම, පරිවාස වාර්තා සකස් කිරීම හා වෙනත් ආයතනික කටයුතු සිදු කිරීම පිළිබඳව ඇතැම් ආයතන වෙතින් තවමත් විමසීම් කරනු ලැබේ. එබැවින් මෙම කරුණු සම්බන්ධව මීට පෙර නිකුත් කරන ලද උපදෙස්වලට වැඩිමනත් ලෙස පහත උපදෙස් නිකුත් කරනු ලැබේ.

(i) <u>වැටුප් ගෙවීම</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/03-05/03/2019 හා 2020.01.17 දිනැති ලිපියෙන් දන්වා ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව මෙම නිලධාරින් හට 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීම් ලබා දී ඇති බැවින්, ඉහත 02 ඡේදයේ සඳහන් පරිදි සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක නියමිත දිනට වැඩ භාර ගත් නිලධාරීන්ට 2020.01.01 දින සිට අදාළ වැටුප් ගෙවිය යුතුය. මෙම වැටුප් ගෙවීම නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයේ තනතුරකට පත්කොට අනුයුක්ත කරන ලද සේවා ස්ථානයෙන් හෝ පසුව සංශෝධනය කරන ලද සේවා ස්ථානයෙන් සිදු කරන මෙන් කාරුණිකව දන්වමි. එලෙස වැටුප් ගෙවීමේදී නිලධාරීන් අභ්‍යාසලාභීන් ලෙස කටයුතු කළ පූර්ව සේවා ස්ථානයෙන් විමසා නිලධාරීන් වෙත ගෙවන ලද අභ්‍යාසලාභී දීමනා හෝ වැටුප් සමඟ ගලපා හිඟ වැටුප් පමණක් අදාල රෙගුලාසිවලට අනුකූලව ගෙවීම් කිරීමට වගබලා ගත යුතුය.

<u>**(ii) පරිවාස වාර්තා**</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති VIII වැනි පරිච්ඡේදයේ 101 වගන්තිය අනුව මෙම නිලධාරීන් සම්බන්ධව පළමු වසරේ සමාලෝචන වාර්තාව සකස් කිරීමේදී එහි අංක 05 පරිශිෂ්ඨය ප්‍රකාර සමාලෝචන වාර්තාවේ අනු අංක 1.4 හි පත්වීම් භාරගත් දිනය සඳහන් කිරීමේදී " 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි (<u>නියමිත පරිදි වැඩ භාරගත් දිනය සඳහන් කරන්න</u>) දින" ලෙසත් අනු අංක 1.6 හි සමාලෝචනයට අදාළවන කාල පරිච්ඡේදය සඳහන් කිරීමේදී "2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි (<u>නියමිත පරිදි වැඩ භාරගත් දිනය සඳහන් කරන්න</u>) දින සිට 2020.12.31 දින දක්වා" ලෙසත් ඇතුළත් කොට නියමිත පරිදි වැඩ භාරගත් දින සිට අදාළ තොරතුරු එම සමාලෝචන වාර්තාවට ඇතුළත් කළ යුතුය.

**උදාහරණ:** "2020.06.15 දින සංවර්ධන නිලධාරී සේවයේ පත්වීම් භාරගත් නිලධාරියෙකු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි අංක 05 පරිශිෂ්ඨය සම්පූර්ණ කිරීම

1.4 පත්වීම් භාරගත් දිනය : 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2020.06.15 දින

1.6 සමාලෝචනයට අදාළවන කාල පරිච්ඡේදය : 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2020.06.15 දින සිට 2020.12.31 දින දක්වා

ඉහත පරිදි සඳහන් කොට 2020.06.15 දින සිට අදාළ තොරතුරු ඇතුළත් කර වාර්තාව සම්පූර්ණ කරන්න."

**(iii) සේවා ස්ථාන සංශෝධනය වීම හේතුවෙන් සේවයට වාර්තා කිරීමට නොහැකි වීම**

2020.06.17 දිනට පෙර වැඩ භාර ගත් ඇතැම් නිලධාරීන්ගේ ඉල්ලීම් මත ඉතා මානුෂීය කරුණු හා අනෙකුත් අත්‍යවශ්‍ය කරුණු සලකා බලා නිලධාරීන් අනුයුක්ත කරන ලද සේවා ස්ථාන සංශෝධනය කිරීමට කටයුතු කරන ලද අතර එලෙස ස්ථාන මාරු කරන ලද නිලධාරීන් COVID – 19 තත්ත්වය, ඒ අනුව පැණවූ ඇඳිරි නීතිය හෝ වෙනත් ආයතනික කරුණු මත සේවයට වාර්තා කිරීමට නොහැකි අවස්ථාවලදී එම සේවයේ නොසිටි කාලය ඔවුන්ගේ ඉදිරි රාජකාරී කටයුතුවලදී ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට අගතියක් නොවන පරිදි වැටුප් සහිත නිවාඩු කාලයක් ( නිලධාරයාගේ පෞද්ගලික නිවාඩු වලින් අඩු නොවන) ලෙස සැලකිය යුතු බවත්, එම කාලයට අදාල වැටුප් ගෙවීම සම්බන්ධව 3 (i) ඡේදයේ දක්වා ඇති උපදෙස් අනුව සිදු කරන මෙන් කාරුණිකව දන්වමි.

04. 2020.06.17 දිනෙන් පසු පුනරුත්තාපනය කරන ලද හා ආබාධිත උපාධිධාරී අභ්‍යාසලාභීන්ට 2020 ජූලි මස 15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය අනුව අංක අමප/20/1044/204/105 හා 2020 ජූලි මස 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/03-05/03/2019 හා 2020.08.27 දිනැති ලිපියෙන් දන්වන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය අනුව 2020.09.07 දිනැතිව සංවර්ධන නිලධාරී සේවයට ස්ථිර පත්වීම් ලබා දුන් අතර, මෙම නිලධාරීන්ට ද 2020.01.01 දින සිට වැටුප් ගෙවිය යුතු වන අතර වැටුප් ගෙවීම සහ පරිවාස වාර්තා ගැනීමට අදාළව ඉහත 03 ඡේදයේ සඳහන් උපදෙස් අදාළ කර ගන්නා මෙන් ද ඉතා කාරුණිකව දන්වමි.

05. තවද 2020.01.01 දිනෙන් පසු දිනයක පත්වීම ක්‍රියාත්මක වන බව පත්වීම් ලිපියේ සඳහන් වන අවස්ථාවලදී එම නිලධාරීන් හට වැටුප් ගෙවීම හා පරිවාස වාර්තාව සැකසීමේදී පත්වීම් ලිපියේ සඳහන් දිනය අදාළ කරගන්නා මෙන් වැඩිදුරටත් දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධසේවා අධ්‍යක්ෂ ජනරාල්